**#mediaethicsSL #lka #SinhalaPress #SundayDivaina #January21**

පුවත්පතක පළවන යම් ප්‍රවෘත්තියක් හෝ ලිපියක් යමෙකු විසින් කියවා එතැනින් එය බැහැර කරන්නේ යැයි යමෙකු සිතා සිටිනවා නම් එය නොදැනුවත්කම විනා අන් කිසිවක් නොවේ. කෙසේ නමුත් කණගාටුව වන්නේ තම ලිපියක් හෝ ප්‍රවෘත්ති වාර්තාවක් මගින් සිදුකෙරෙන සමාජ බලපෑම නොදැන කටයුතු කිරීමෙන් හෝ නොදන්නා ලෙසින් හැසිරීමෙන් යම් යම් පුවත්පත් මගින් මාධ්‍ය අවභාවිතාවක නිරත වීමයි. උදාහරණයක් ලෙසින් දිවයින පුවත්පත මගින් ප්‍රකාශ කළ මෙම ලිපිය දැක්විය හැක. මෙහිදී එම කණගාටුදායක සිදුවීම රස කරමින් විස්තර කිරීමක් විනා සංයමයෙන් යුතුව, ආචාර ධාර්මිකව කරුණු ගෙනහැර පෑමක් දකින්නට නොමැත. මෙහිදී මාධ්‍ය ආචාර ධර්මයන් ගණනාවක් උල්ලංඝනය කර තිබෙනා අතර, අඩු තරමින් සියදිවි නසාගැනීමක් සිදුකළ ආකාරය දිගින් දිගටම විස්තර කිරීම හරහා අනුකරණාත්මක සියදිවි හානිකරගැනීම් සඳහා මං සැලසෙන්නේය යන කරුණ සම්බන්ධයෙන් හෝ නොදැනුවත්ව අදාළ මාධ්‍යවේදියා විසින් කටයුතු කර ඇති බව පෙනේ. එසේම සියදිවි නසාගැනීම් අවම කිරීමේ චේතනාවෙන් හදිසි උපකාරක අංක (1333) ස්ථාපනය කොට තිබියදී පවා එම අංක ලිපිය සමගින් පළ කොට නොමැති වීමද නිරීක්ෂණය කළ හැක. මේ කිසිසේත්ම වගකීම් සහගත මාධ්‍යකරණයක් නොවේ!